
# අකීකරු මල්ලී



තුල්මි චමත්කාරා ලියනගේ

# අඹකරු මල්ලී

තුල්මි චමත්කාරා ලියනගේ

“අකීකරු මල්ලී”

කර්තෘ ප්‍රකාශනයකි

පළමුවන මුද්‍රණය 2023 ඔක්තෝබර්

ISBN 978-624-206-908-1

කතාව සහ චිත්‍ර

තුල්මි චමත්කාරා ලියනගේ

2 ශ්‍රේණිය

මහාමායා බාලිකා විදුහල

කතුවරියගේ වෙනත් කෘති

**ඉමී සහ බිලී** - 2023

# පිදුම

මෙම කතන්දර පොත ලිවීමට

මා උනන්දු කරවූ

චාමිනි පල්ලියගුරු ගුරු මෑණියන්ටත්

මාගේ ආදරණීය

අම්මාටත්, තාත්තාටත්

පුදකරමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.


2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.


මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට පිවයක් වූ සෙනෙවිරත්න මහලේකම් මහතාගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර,
විදුහල්පතිනිය.
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.
2023 .10 . 20

එකමත් එක ගමක අයියා කෙනෙකුයි මල්ලී කෙනෙකුයි හිටියා. අයියා කීකරුයි. මල්ලී අකීකරුයි. අම්මා එපා කියන දේවල්ම මල්ලී කරනවා.



දවසක් මල්ලී අම්මාගේ පර්ස්
එක අරගෙන ඒකේ සල්ලි
අතගගා හිටියා.



ඒක දැකපු අයියා "මල්ලී අම්මාගේ පර්ස් එක අදින්න එපා. ඒක හොඳ නැති වැඩක්" කියලා මල්ලීට කිවුවා.

මල්ලී අයියා කියන දේ ඇහුනේ නැහැ වගේ හිටියා. අයියා ටිකක්වෙලා බලන් ඉඳලා එතනින් ගියා.

අම්මා බඩු ගන්න යන්න ලෑස්ති

වෙලා පර්ස් එක ගන්නකොට

ඒකේ සල්ලි අඩුවෙලා තිබුණා.

අම්මා අයියා ගෙන් ඇහුවා.

අයියා කිවුවා මල්ලී ලාච්චුව

අදිනවා දැක්කා කියලා.

මල්ලීට අම්මා කතා කලා.

"පර්ස් එකේ සල්ලි ගත්තා ද?"

කියලා ඇහුවා. මල්ලී "ඔව්"

කිවුවා. "පුතාලා අම්මලාගේ


පර්ස් අරගන්නේ නැහැ.
අහන්නේ නැතුව කිසි දෙයක්
ගන්න හොඳ නැහැ"අම්මා
කිවුවා.
"මම දැන් ලොකුයි" මල්ලී
කිවුවා.
"ඔයා ලොකු වුනත් පොඩි වුනත්
යමක් ගද්දී අහලා ගන්න ඕන"
අම්මා මල්ලීට කිවුවා.
"ඒ වාගේම ඉස්කෝලේ යන

ළමයි සල්ලි ළඟ තියා ගන්නේ නැහැ" කියලත් කිවුවා.




මල්ලී අම්මා කියන දේ ඇහුවේ නැහැ. අම්මා මේක තාත්තාට කිවුවා. තාත්තා මල්ලීට අවවාද කළා. ළමයි ඉන්න ඕන හැටි කියලා දුන්නා.

"අයියා වගේ ඔයත් කීකරු වුණොත් අම්මාටයි තාත්තාටයි ගොඩක් සතුටුයි" තාත්තා කිවුවා.



මල්ලී ටිකක් කල්පනා කළා.



ගත්ත සල්ලි ආපසු දුන්නා.
අම්මාගෙන් සමාව ගත්තා.

අයියා වගේම කීකරු දරුවෙක්
වෙන්න පොරොන්දු වුණා.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුලින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුලින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20

ISBN 978-624-206-908-1